## ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව
## අංක: 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය

**දූරකථනය: 2863705 / 2868002 / 2867533 / 867369 / ෆැක්ස් 2884805**

## ඉඩමක් සංවර්ධනය කරගැනීම සඳහා නිරවුල් සහතිකයක් ලබා ගැනීම

---

ඉඩමේ අයිතිකරු විසින් මේ සමග ඇති අයදුම්පත් (පිටපත් 02 කින්) නිසියාකාරව සම්පූර්ණ කර අදාළ ඉඩමේ පිඹුරුපතෙහි ඡායා පිටපත් 03 ක් සහ ඔප්පුවේ පැහැදිලි ඡායා පිටපත් 01 ක්ද, අදාළ ඉඩම් සම්බන්ධයෙන් මසක් ඇතුළත ලබාගත් පත්ඉරු (Extract) සමග අප වෙත ඉදිරිපත් කළ යුතුය.

සංවර්ධනය කිරීමට නියමිත ඔබගේ ඉඩමට අප ප්‍රධාන කාර්යාලයේ සිට දුර ප්‍රමාණය සහ ඉඩමේ විශාලත්වය අනුව, මෙම සංස්ථාව විසින් අය කිරීමක් කරනු ලැබේ. මෙසේ කරනු ලබන සේවා ගාස්තු වලින් ආපසු නොගෙවනු ලබන අත්තිකාරම් මුදලක් වශයෙන් රු.5,090.14 ක්, 2.5% ක සමාජ ආරක්ෂණ බද්ද සහ 15% ක වැට් බද්දෙහි එකතුව ලෙස **රු.6,000.00 ක** මුදලක් අයදුම්පත භාරදෙන අවස්ථාවේදී ගෙවිය යුතුය.

මුදලින් ගෙවීමේදී **සතියේ දිනවල ප.ව.3.00 ට පෙර** විශේෂ ව්‍යාපෘති අංශයට පැමිණිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. (ලියාපදිංචි වැට් අංකය 409010563-7000)

ඔබගේ අයදුම්පත තැපැල් මාර්ගයෙන් අප වෙත යොමු කරන්නේනම් අදාළ මුදල් ලංකා බැංකුවේ ඕනෑම ශාඛාවක අපගේ **ගිණුම් අංක - 3270388** වෙත බැරකර මුදල් ගෙවූ රිසිට්පත අයදුම්පත සමග අමුණා අපවෙත ඉදිරිපත් කළ යුතුය.(එසේම මුදල් තැන්පත් කරන්නාගේ නම හා අවශ්‍ය කාරණය රිසිට්පතෙහි සටහන් කළ යුතුය.)

මුදල් ගෙවීමෙන් පසුව, ඒ සඳහා ලැබෙන කුවිතාන්සිය සමග අයදුම්පත සහ අදාළ ලේඛන අපගේ **විශේෂ ව්‍යාපෘති අංශය** වෙත බාරදී ඔබගේ ලිපිගොනුව සඳහා අංකයක් ලබාගත යුතුය. සංස්ථාව සමග මතුවට සිදුකෙරෙන ලිපි ගනුදෙනු වලදී එම ලිපිගොනු අංකය අනිවාර්යෙන්ම සඳහන් කළ යුතුය.

ඔබගේ ලිපිගොනුව සම්බන්ධයෙන් කිසියම් විමසීමක් කළ යුතුව ඇත්නම්, ඒ සඳහා සතියේ බදාදා දිනයේ අදාළ නිලධාරීන් හමුවිය හැකිය.

සංවර්ධනය කිරීමට අවශ්‍යව ඇති ඉඩමේ නම කුඹුරු, ඹිවිට හෝ දෙණිය ලෙස සඳහන්ව ඇත්නම් අදාළ අයදුම්පත මෙම සංස්ථාවට ඉදිරිපත් කිරීමේදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ඉල්ලීම සමග ඉදිරිපත් කළ යුතුය. ඉඩම් සංවර්ධනය සඳහා අවසර ඉල්ලීමේදී අපේක්ෂිත සංවර්ධන කටයුතු සඳහා **අදාළ පළාත් පාලන ආයතනයේත්, (ප්‍රාදේශීය සභාව/නගර සභාව/මහනගර සභාව), නාගරික සංවර්ධන අධිකාරියේ සහ මධ්‍යම පරිසර අධිකාරියේ** අනුමැතිය සමග ඉදිරිපත් කළ යුතුය. අදාළ ඉඩම සංවර්ධනය කළ හැකි බව හෝ නොකළ හැකි බව ඔබ වෙත දැනුම්දීම සඳහා මාස 03 ක පමණ කාලයක් ගතවිය හැකි බව කරුණාවෙන් සලකන්න.

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (විශේෂ ව්‍යාපෘති)
ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව